www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# විජේ ඩයස් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් අමතා ගෝලීය ආර්ථික අර්බුදය පිලිබඳ කතා කරයි

## Wije Dias addresses Sri Lankan university students on global economic crisis

**අපගේ වාර්තාකරුවන් විසිනි**
**2008 දෙසැම්බර් 12**

සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) ප්‍රධාන ලේකම් විජේ ඩයස් දෙසැම්බර් 3 දා ''ධනවාදයේ නෛසර්ගික අර්බුදය සහ සමාජවාදී විකල්පය'' යන මැයෙන් කොලඹ විශ්වවිද්‍යාලයේ දී ප්‍රසිද්ධ දේශනයක් පැවැත්විය. එම දේශනය පසුගිය වසර 4 ඇතුලත කොලඹ විශ්වවිද්‍යාලයේ දී සමාජවාදී දේශපාලනය පිලිබඳව පැවැත්වූ ප්‍රථම දේශනයයි.

දේශනය සඳහා ඩයස්ට ආරාධනා කලේ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය කන්ඩායමක් වන ප්‍රවාද කවයයි. එයට ශිෂ්‍යන් 30ක් පමන සහභාගී වූහ. ශිෂ්‍ය කවය වෙනුවෙන් රැස්වීමේ මුලසුන දැරුවේ අවසන් වසර නීති ශිෂ්‍යයෙක් වන සංජය විල්සන් ය. සසප සමග කටයුතු කරන සමාජ සමානතාවය සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ (සසජාශි) රැස්වීම ඉලක්ක කර ගෙන සිසුන් අතර උද්ඝෝෂනයේ යෙදෙමින් එයට මූලිකත්වය ගත්හ.

ඩයස් සිය කතාව ආරම්භ කලේ තමන්ට ආරාධනා කිරීම වෙනුවෙන් ප්‍රවාද කවයට ස්තුති කරමිනි. ගැඹුරු වන ගෝලීය අවපාතය ලොව පුරා වැඩ කරන ජනයා තරුනයන් සහ පීඩිත මහජනතාව මත දැනටමත් බේදජනක විපාක ඇති කරමින් තිබෙන බව ඔහු විස්තර කලේ ය. ධනවාදයේ අර්බුදය මහා බලවතුන් අතර ප්‍රතිමල්ලතාවයන් සහ යුද්ධවල තර්ජනය ඉස්මතු කරන බවට ඔහු අනතුරු ඇඟවීය. 1938 වසරේ දී ලියොන් ට්‍රොට්ස්කි විසින් ලියන ලද හතරවන ජාත්‍යන්තරයේ ආරම්භක වැඩපිලිවෙලින් උපුටා දක්වමින් ඩයස් කතා කලේ ය. ''සමාජවාදී විප්ලවය සිදු නොවුනහොත් ඊලග ඓතිහාසික කාලපරිච්ඡේදයේ දී මානව වර්ගයාගේ සකල සංස්කෘතියට ම බේදවාචකයක තර්ජනය එල්ල වේ. දැන් එලඹී ඇත්තේ නිර්ධනයින්ගේ එනම් ප්‍රමුඛ වශයෙන් එහෙයින් විප්ලවවාදී පෙරටු බලඇනියේ වාරයයි. මානව වර්ගයාගේ ඓතිහාසික අර්බුදය විප්ලවවාදී නායකත්වයේ අර්බුදය බවට සිඳී ඇත.'' යයි සමාජවාදී විප්ලවය සඳහා මෝරා ඇති කොන්දේසිවලට අවධානය යොමු කරමින් ට්‍රොට්ස්කි අවධාරනය කලේ ය.

ඩයස් මෙසේ පැවසී ය. ''අප දැන් සාකච්ඡා කරමින් සිටින්නේ තවත් තර්ජනාත්මක බේදවාචකයක් වලක්වන්නේ කෙසේ ද යන්න යි.'' ඉතිහාසයෙන් පාඩම් උකහා ගැනීමේ අවශ්‍යතාව පිලිබඳව අවධාරනය කරමින් ලෝක ධනවාදයේ නෛසර්ගික පරස්පර විරෝධයන්ට වඩාත් අතිමූලිකව ලෝක යුද්ධ දෙකකට මග පෑදූ ලෝක ආර්ථිකය සහ යල්පැන ගිය ජාතික රාජ්‍ය පද්ධතිය අතර පරස්පර විරෝධය පිලිබඳව ඔහු විස්තර ගෙන හැර දැක්වීය. 1917 රුසියානු ඔක්තෝබර් විප්ලවය වනාහී ලෙනින් හා ට්‍රොට්ස්කිගේ නායකත්වය යටතේ බොල්ශෙවික් පක්ෂය විසින් මෙහෙයවන ලද කම්කරු පන්තිය යුද්ධයේ ව්‍යසනයට දැක්වූ දැනුවත් ප්‍රතිචාරය බව ඩයස් විස්තර කලේ ය.

''ධනවාදයේ පරස්පර විරෝධයන්ගේ ප්‍රතිඵලයක් ලෙස එම පද්ධතිය බිඳ වැටේය යන ප්‍රකාශනය කරන විට එම ක්‍රමය ක්ෂනිකව නවතී යයි අපි අදහස් නොකරමු. අප විභාග කරමින් සිටින්නේ ධනේශ්වර පද්ධතියේ ගැඹුරු වන්නා වූ අර්බුදයකි.'' යනුවෙන් ඩයස් පැවසී ය. පාලක පන්තිය විසින් සූදානම් කරනු ලබන ව්‍යසනය කම්කරු පන්තිය බලය ලබාගැනීම සෘජුව ම ඉස්මතු කලේ ය.

දෙවන ලෝක යුද්ධයෙන් පසුව තම ආර්ථික බලය පාවිච්චි කොට එක්සත් ජනපද අධිරාජ්‍යවාදය ධනවාදය ප්‍රතිස්ථාපනය කිරීමට මූලිකත්වය ගත් බව ඩයස් පැහැදිලි කලේ ය. එසේ කල හැකි වීම සිදුවූයේ සියල්ලට ඉහලින් ලොව පුරා ස්ටැලින්වාදී පක්ෂ ඇතුලත්ව කම්කරු පන්තියේ නායකත්වයන්ගේ පාවාදීම හේතුවෙනි. 1950 ගනන් වල උත්පාත කාල සීමාවකට පසුව එක්සත් ජනපදයේ ආර්ථික තත්වය එහි ප්‍රතිමල්ලවයන්ගේ යලි ඉස්මතු වීම මගින් දුර්වල කරනු ලැබූ අතර ලොව පුරා කම්කරුවන්ගේ අරගල පුපුරා යාම සිදු වූ 1968-1975 අතර කාලයේ ධනේශ්වර පද්ධතිය තවත් අර්බුදයකට මුහුන දුන්නේ ය.

ලොව පුරා ආර්ථික ක්‍රියාවලීන් ඒකාග්‍ර කිරීමට තාක්ෂනයේ විප්ලවීය වෙනස්කම් භාවිතා කිරීම හරහා නිෂ්පාදනයේ භූගෝලීයකරනය වීම ආර්ථික අර්බුදයට පාලක පන්තියෙන් දැක්වූ ප්‍රතිචාරය වී යයි ඩයස් විස්තර

කලේ ය. 1991 දී සෝවියට් සංගමය බිඳවැටීමෙන් පසුව ලොව පුරා ධනපති පන්තිය සමාජවාදය මිය ගිය බවත් එකම සත්‍ය ආර්ථික පද්ධතිය ධනවාදය බවත් ප්‍රකාශ කලේ ය.

කෙසේ වෙතත් ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය පැහැදිලි කලේ සෝවියට් සංගමයේ බිඳවැටීම වනාහී ජාතික, ආර්ථික, පාලනය මත පදනම් වූ සියලු වැඩපිලිවෙලවල්වල බංකොලොත් භාවයේ තියුනු ම ප්‍රකාශනය පමනක් විය. භූගෝලීයකරන ක්‍රියාදාමයෝ වර්තමානයේ ධනපති ක්‍රමයේ නව අර්බුදයක පුපුරායාම තුලින් ප්‍රකාශය අත්පත් කර ගන්නා ධනවාදයේ අතිමූලික පරස්පර විරෝධයන් අවුලුවා තිබුනා පමනි.

තම ආර්ථික පරිහානිය වෙනතකට හැරවීම සඳහා මිලිටරි ක්‍රම එක්සත් ජනපද අධිරාජ්‍යවාදය විසින් භාවිතා කිරීමට තතනන බව ඩයස් පැහැදිලි කලේ ය. බුෂ් පරිපාලනය ඇෆ්ගනිස්තානය හා ඉරාකය ආක්‍රමනය කිරීමේ එල්ලය වන්නේ මධ්‍යම ආසියානු කලාපයේ බලශක්ති මූලාශ්‍ර මත එක්සත් ජනපද ආධිපත්‍යය පිහිටුවීමත් තම ආර්ථික ප්‍රතිමල්ලවයන් එම මූලාශ්‍රවලට අතගසාගැනීමෙන් වැලැක්වීමත් ය. යලිවතාවක් අන්තර් අධිරාජ්‍යවාදී ප්‍රතිමල්ලවතා වර්ධනය වෙමින් තිබේ.''

ශ්‍රී ලාංකික නායකයෝ සහ ආන්ඩුවේ නිලධාරීහු ගෝලීය ආර්ථික අර්බුදයේ බලපෑම ලඝු කිරීමට උත්සාහ දරා ඇති බව කතිකයා අවධානයට ලක් කලේ ය. එක්සත් ජනපද සහ යුරෝපීය වෙලඳපොලවල් සංකෝචනය වීම සමගින් තේ සහ රබර් මිල ගනන් නාටකාකාර ඇද වැටීමෙන් දැනටමත් බොහෝ වැඩ කරන ජනතාවන්ට බලපාමින් තිබේ. කම්කරුවන් සියදහස් ගනනකගේ රැකියා පරදුවට තැබී ඇත. රටෙහි ආර්ථික අර්බුදය යුද්ධය සහ අතිවිශාල මිලිටරි වියදම් වලින් තියුනු කරමින් පුපුරන සුලු දේශපාලනික තත්වයක් නිර්මානය කරමින් තිබේ.

''කම්කරුවන් සහ තරුනයන් සමාජවාදී ඉදිරි දර්ශනයකට සහ වැඩ පිලිවෙලකට දිනා ගත හැකි වීමේ වෛෂයික කොන්දේසි වර්ධනය වෙමින් තිබෙනවා. ඔවුන්ගේ අයිතිවාසිකම් සහ කොන්දේසි ආරක්ෂා කර ගැනීමට වෙනත් විකල්පයක් නැහැ'' යයි ඩයස් අවධාරනය කලේ ය. සසප ඉදිරිදර්ශනය සහ වැඩ පිලිවෙල අධ්‍යයනය කරමින් සහ සසජාශි සමග සම්බන්ධ වීමෙන් සමාජවාදී අනාගතයකට සටන් කිරීමේ වගකීම බාරගන්නා ලෙස ඔහු ශ්‍රාවකයන්ට ආයාචනා කලේ ය.

දේශනයෙන් පසුව සජීවී සාකච්ඡාවක් පැවතුනි. සේවා කර්මාන්තයේ වර්ධනය සහ එම අංශය තුල කම්කරුවන් සංඛ්‍යාව වැඩි වීම පිලිබඳව එක් ශිෂ්‍යයෙක් සඳහන් කලේ ය. එම ස්තරය අතර කම්කරු පන්ති විප්ලවයකට අවශ්‍ය විඥානය පවතීද ඔහු විමසා සිටියේ ය.

සේවා අංශයේ කම්කරුවන් යනු කම්කරු පන්තියේ කොටසක් බව ඩයස් විස්තර කලේ ය. ''කලින් කාල පරිච්ඡේදයේ අගුලු ලා තිබුනු චීනයේ, සෝවයට් සංගමයේ. නැගෙනහිර යුරෝපයේ සහ ඉන්දියාවේ ආර්ථිකයන් ලෝක ආර්ථිකය සමඟ ඒකාග්‍රවීම මගින් ලෝක කම්කරු පන්තියේ සංඛ්‍යාත්මක ශක්තිය අතිශයින් ඉහල ගොස් තියෙනවා. එය යෝධ විප්ලවවාදී සාධකයක්.

විප්ලවවාදී විඥානය නොමැතිවීම කම්කරු පන්තියේ ඓන්ද්‍රීය දෝෂයක් නොවේ. එයට ඓතිහාසික හේතුව පවතින්නේ කම්කරු පන්තියේ අතීත නායකත්වයන්ගේ පාවාදීම් තුල ය.'' යි ඩයස් කීය. ඔහු විශේෂයෙන් සඳහන් කලේ 1964 දී සිරිමා බන්ඩාරනායකගේ සභාගයට ඇතුලුවීම මගින් ලංකා සමසමාජ පක්ෂය කල මහා පාවාදීමේ ප්‍රතිවිපාක පිලිබඳවයි. කම්කරු පන්තියේ එකමුතුව මත පදනම් වූ සමාජවාදී විකල්පයක් නොමැති වීම විශාල ව්‍යාකූලත්වයක් නිර්මානය කල අතර එය ග්‍රාමීය සිංහල දිලිඳු තරුනයන් අතර ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) සහ පීඩිත දෙමල ජනයා අතර දෙමල ඊලම් කොටි සංවිධානය (එල්ටීටීඊ) වැනි වාර්ගික දේශපාලනය මත පදනම් වූ සුලු ධනේශ්වර රැඩිකල් ව්‍යාපාර බිහිවීමට හේතු විය.

''කම්කරු පන්තිය පාවාදීම්වලට අකමැති වූයේ නම් එම පාවාදීම්වලට විරුද්ධ වූ ව්‍යාපාරවලට කම්කරු පන්තියේ එම විරුද්ධත්වය ප්‍රයෝජනයට ගත නොහැකි වූයේ මන්ද? යනුවෙන් ප්‍රශ්න කරමින් විශ්ව විද්‍යාල දේශකයකු හා පශ්චාත් නූතනවාදී ''එක්ස්- කන්ඩායමේ නායකයා වන නිර්මාල් රංජිත් දේවසිරි කම්කරු පන්තියේ විප්ලවවාදී ධාරිතාව පිලිබඳ ඔහුගේ සංශයවාදී ආකල්පය ප්‍රකාශ කලේ ය.

දේශපාලන පාවාදීම්වලට වගකිවයුත්තන් හෝ ඔවුන්ගේ දේශපාලන ක්ෂමාලාපකයන් ලාක්ෂනිකව ම කම්කරු පන්තිය මතට වරද පැටවීමට උත්සාහ දරන බව ඩයස් පැහැදිලි කලේ ය. ''පාවාදීම් මගින් බලපෑමක් ඇතිවෙනවා. අපට එය අඩු තක්සේරු කිරීමට බැහැ. අප එම ප්‍රශ්නයට ඓතිහාසිකව ප්‍රවිෂ්ට විය යුතුයි.'' යනුවෙන් ඔහු කීවේය.

ස්ටැලින්වාදී නිලධාරි තන්ත්‍රය විසින් 1927 - චීන විප්ලවය පාවාදීමේ උදාහරනය ගෙනහැර දක්වමින් ඩයස් අවධාරනය කලේ ට්‍රොට්ස්කිගේ තරුන ආධාරකරුවෝ ඔහුගේ අනතුරු ඇඟවීම් සනාතවීම මගින් වාම විරුද්ධපාර්ශවයේ තත්වය වැඩි දියුනු වනු ඇතැයි ප්‍රකාශ කොට තිබුනු බවයි. එහෙත් ට්‍රොට්ස්කි අනතුරු ඇඟවූයේ එම පරාජය සෝවියට් කම්කරුවන් දුර්මුඛ කොට ස්ටැලින්වාදී නිලධාරි තන්ත්‍රය ශක්තිමත් කරනු ඇති බවයි.

කම්කරුවන්ගේ සහ තරුනයන්ගේ විඥානය මත යෝධ බලපෑමක් ඇතිකල ලසසප පාවාදීම ඩයස් යලිත් ගෙනහැර දැක්වී ය. එම පාවාදීම ධනපති පන්තියට එරෙහි ශක්තිමත් දේශපාලන අභියෝගයක් ඉවත් කලා පමනක් නොව කම්කරු පන්තියේ දේශපාලන ස්වාධීනත්වයට ද වල කැපීය. එමගින් කම්කරු පන්තිය දුර්වල කොට වාර්ගික දේශපාලනයට ආධිපත්‍යය ලබා දී අවසානයේ විසිපස් අවුරුදු සිවිල් යුද්ධයට පාර කැපීය. දේශපාලනික ප්‍රතිගාමී කාල පරිච්ඡේදයේ දී විප්ලවවාදී අදහස්වලට කිසිදු අභිවර්ධනයක් ඇති කිරීම අපහසු වීම ඩයස් විස්තර කලේ ය. ''පාවාදීම්වල බලපෑම කපා දැමීම හුදු දේශපාලනික වාද විවාද මඟින් ස්වයංක්‍රීයව සිද්ධ කිරීමට බැහැ. කම්කරුවන්ට අලුතින් සිදු කිරීමට බල කරන වෛශයික ලෝකයේ වෙනස්කම් ඇති විය යුතු ය''යි ඔහු එයට එකතු කලේ ය. එබඳු කාල පරිච්ඡේදයක් ඉස්මතුවීම ආරම්භ වෙමින් තිබෙන බවත් එමගින් තරුන ජනයාට සහ කම්කරුවන්ට ධනේශ්වර ම්ලේච්ඡත්වයට එරෙහිව සමාජවාදී විකල්පය පිලිබඳව ගැඹුරට සිතීමට බල කරන බවත් ඔහු කීවේ ය.

© www.wsws.org